මගේ අංකය - CSD/01/01/15 | වක්‍රලේඛ අංක 02/2015(II)

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
අංක 23, දුම්රියපොළ පාර
බම්බලපිටිය.
2016.05.

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
සියළුම අධ්‍යක්ෂක වරුන්/ නියෝජ්‍ය අධ්‍යක්ෂ වරුන්/ සහකාර අධ්‍යක්ෂ වරුන්,
සියළුම අංශ භාර නිලධාරීන්,
සියළුම බලකා භාර අණදෙන නිලධාරීන්/ පුහුණු කඳවුරු භාර අණදෙන නිලධාරීන්,
හා ව්‍යාපෘති භාර නිලධාරීන් වෙත.

**<u>රජයේ ආයතන සහ නිලධාරීන් සඳහා සන්නිවේදන පහසුකම් සැපයීම සහ බිල්පත් නිරවුල් කිරීම</u>**

ඉක්ත මැයෙන් නිකුත් කළ අංක 2/2015 හා 2015/02/16 දිනැති අභ්‍යන්තර වක්‍රලේඛය හා බැඳේ.

02. එම වක්‍රලේඛයේ 3 වන ඡේදයෙහි දැක්වෙන වගුවෙහි කාණ්ඩ අංක 06 ලෙස "නිශ්චිත නිලධරයෙක් සඳහා වෙන් නොවුන දෙපාර්තමේන්තු මූලස්ථානයේ අංශ සතුව පවතින දුරකථන සඳහා උපරිම වියදම් සීමාව රු.2500.00ක් ලෙස ඇතුලත් කරමින් සහ එහි 11 වන පරිච්ඡේදයේ iv වන වගන්තිය වෙනුවට දැනට දෙපාර්තමේන්තුව සතු සියළුම දුරකථන සඳහා මු.රෙ. 850 ප්‍රකාරව (මු.රෙ. 29 වන පරිශිෂ්ට ආකෘතිය අනුව) දුරකථන ඇමතුම් ලේඛණ පවත්වා ගත යුතු බව" ඇතුළත් කරමින් සංශෝධනය කරනු ලැබේ.

| I<br>කාණ්ඩ අංකය | II<br>නිලධාරී කාණ්ඩය | III<br>උපරිම වියදම් සීමාව (සියළුම බදු හා මාසික ගාස්තු ඇතුලත්ව) රුපියල් | |
|---|---|---|---|
| | | (අ)<br>රාජකාරී කාර්යාල දුරකථනය | *(ආ)<br>රාජකාරී නිවාස දුරකථනය/ ජංගම දුරකථනය/ අන්තර්ජාල සම්බන්ධතාවය සඳහා නිලධාරියාට ගෙවන දීමනාව |
| 01 | අධ්‍යක්ෂ (ජනරාල්) | 6,000.00 | 8,000.00 |
| 02 | අතිරේක අධ්‍යක්ෂ (ජනරාල්) / අධ්‍යක්ෂ | 4,000.00 | 5,000.00 |
| 03 | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 3,000.00 | 4,000.00 |
| 04 | සහකාර අධ්‍යක්ෂ | 2,500.00 | 2,500.00 |
| 05 | පරිපාලන නිලධාරී | 2,000.00 | 2,000.00 |
| 06 | නිශ්චිත නිලධරයෙක් සඳහා වෙන් නොවුන දෙපාර්තමේන්තු මූලස්ථානයේ අංශ සතුව පවතින දුරකථන | 2,500.00 | - |

03. මේ වන විට දෙපාර්තමේන්තු මූලස්ථානයේ අංශ වෙත ලබා දී ඇති ෆැක්ස් පහසුකම් සැපයීම සඳහා වෙන් කර ඇති දුරකථන සඳහා මාසික වියදම් සීමාව කළමනාකරණය කර ගැනීමට අදාල අංශ භාර අධ්‍යක්ෂවරුන් / මාණ්ඩලික නිලධාරීන් විසින් තරයේම වගබලා ගත යුතුය.

04. මෙම වක්‍රලේඛය මගින් සංශෝධිත විධිවිධාන 2016/05/01 දින සිට අදාල කර ගත යුතු අතර 02/2015 වක්‍රලේඛයේ සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසම ක්‍රියාත්මක වේ.

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
නො: 23, දුම්රියපොළ පාර,
බම්බලපිටිය, කොළඹ-04.

පිටපත - ලේකම් , ආරක්ෂක අමාත්‍යාංශය